16 වන පිටෙන්

හෝ දෙනා අහන ප්‍රශ්නය මම ම සම්පූර්ණ කරන්නම්. "ඇතැමුන් අහනවා... ටියුෂන් මැජික් නාට්‍යය, ටියුෂන් ගුරුවරු විවේචනය කිරීමක් ද කියලා?" එහෙම නේද?
මගේ මුවගට එන ක්ෂණික පිළිතුර මේක. අපේ නාට්‍ය කලා අභ්‍යාසය කැලෑ පත්තර කලාවක් නෙමෙයි. මම උත්සහ කරන්නං මේ ගැන හැකි පරිදි පැහැදිලි කරන්න.
නිර්මාණ කරුවෙක් බොහෝවිට නිර්මාණය කට මුල පුරන්නේ ඒ වස්තු විෂය සමග බැඳි සංවේදී කරුණු කාරණා නිසා. මමත් 'ටියුෂන් මැජික්' නාට්‍ය නිර්මාණයට යොමු උනේ මේ නිර්මාණයේ වස්තුවිෂය සමග බැඳි, මාව සංවේදී කළ අත්දැකීම් ගණනා වක ප්‍රතිපලයක් විදියට.
ඒත් එතැනදී මා අත්විඳි අවස්ථාවන්ට දායක උනේ කවුද කියන එක මම නිර්මාණයට අදාල කරගෙන නැහැ. නිදසුනක් විදියට මම එක අවස්ථාවක් පමණක් සඳහන් කරන්නම්. මේ සිදුවීම සිද්ද උනේ මමත් යශෝධරත් හෝගානා පොකුණ චිත්‍රපටයේ වැඩකටයුතු සඳහා ලංකාවට ගොස් සිටින කාල වකවානුවේ දිනක. දිනක් මගේ ඥාති සහෝදරයෙක් රාත්‍රී දහය පසුවී ඇති මො හොතක අප නවාතැන් ගෙන සිටි නිවහනට ගොඩවුනා. අවුරුදු 8ක් වයසැති ඔහුගේ දියණියගේ පාසැල් බෑගයද අතැතිව. මතක පරිදි අපේ සංවාදය උනේ මෙහෙම.

**මම:** මල්ලි කොහෙද ගියේ?
**ඥාති සොයුරා:** දුවගේ ශිෂ්‍යත්ව පංතිය කට අය්යයේ.
**මම:** කෝ දුව?
**ඥාති සොයුරා:** එයාට සනීප නැහැ. ගෙදර. හොදටම උණ. හවස අම්මත් එක්ක බෙහෙතුත් ගෙනාව.
**මම:** එතකොට පංති ගියේ?
**ඥාති සොයුරා:** මම ගියා.
**මම:** දුවගේ පන්තියට?
**ඥාති සොයුරා:** ඔව් අය්යේ. නැත්තන් පාඩු වෙනවනේ.
**මම:** එතකොට ළමයගේ ශිෂ්‍යත්ව පංතියට තාත්තලා අම්මලා යනවද?
**ඥාති සොයුරා:** අපෝ ඔව් ඕන තරං එනවා.
**මම:** එතකොට කීයටද පංති පටන් ගන්නේ?
**ඥාති සොයුරා:** ශිෂ්‍යත්ව පංතිය 8 ඉදන් රෑ 10 වෙනකන්. අද ගණන් පංතියයි ඉංග්‍රීසි පංතියයි දෙකම මිස් උනා.
**මම:** ඒවා තියෙන්නේ කීයටද?
**ඥාති සොයුරා:** 3 ඉදන් 5 වෙනකන් ගණන්- 67 ඉංග්‍රීසි.
**මම:** එතකොට වෙනදට දුව රෑ දහය වෙනකල් ක්ලාස් ගිහින් පහුවදා උදේට ඉස්කෝලේත් යනවා?
**ඥාති සොයුරා:** අපෝ ඔව්- එයාට දැන් පුරුදුයි.
**මම:** එතකොට මල්ලි දුවගේ ශිෂ්‍යත්ව විභාගේ මේ අවුරුද්දේද?
**ඥාති සොයුරා:** නෑ අය්යේ- තව දෙකක් තියනව.

මගේ මනසේ දෝංකාර දෙන ඒ සංවාද පෙළ ගැන විශ්ලේෂණය කිරීම ඔබට ඉතිරි කරන්නං. ඒ දෝංකාරය තුළින් මා තුළ ඇති උන කම්පනය ටියුෂන් මැජික් නිර්මාණයට මාව යොමුකළ කරුණු අතරේ වෙන එක කරුණක්. මෙවැනිම කම්පනයක් ඇතිකළ අවස්ථා කිහිපයක් මම අත්වින්දා මෙල්බර්න් වලදීත් මේ අත්දැකීම් සියල්ල මම භාර ගත්තේ, කොන්ස්ටැන්ටයින් පවුතවුස්කි ගෙ "රන් රෝස" කෘතියේ සටහන් වෙන රන්සුණු වගේ. ටියුෂන් මැජික් නිර්මාණය බිහිවෙන්නේ මේ අත්දැකීම් සියල්ලේ උත්තේජනයෙන්. ළමයට අහිමිවීගෙන යන ළමා කාලය ගැන අපේ සංවේදී ප්‍රකාශනය එළිදක්වන්න මාත් යශෝධාරත් දරන උත්සාහයක ප්‍රතිපලයක් තමයි "ටියුෂන් මැජික්" කියන්නේ.
කෙනෙක් නිර්මාණයක් නොදැක නිර්මාණය ගැන කරන විවේචනය පදනම් විරහිත එකක්. ප්‍රේක්ෂකාගාරයේ සාමාජිකයෙක් වෙලා කෙනෙකු තුළ ඇතිවෙන විනිශ්චය එක්ක සංවාදයකට මුලපිරීම තමයි වැදගත් වෙන්නේ.
බොහොමයක් වෙලාවට බහුතරයක් අපි තුළ තියෙන ගැටළුවක් වෙන්නේ, දෙයක පෙනෙන කළු පැහැය හෝ සුදු පැහැය පමණක් දැකීම- ඒ අතර තුර තිබෙන අළු පැහැයන් දකින්න අකමැති කම, හුරුවෙලා නැති කම, කලා කෘතියකින් හැකියාවක් තිබෙනවා එකී අතරමැද අළු පැහැයන් දකින්න මිනිස් මනසට ආරාධනා කරන්න.
අපේ උත්සාහය ඒක, නැතුව මම ටියුෂන් විරෝදී කෙනෙක් විදියට පුවරුවක් එල්ලන එක වැරදියි. යම් මොහොතක මගේ දරුවෝ කීවොත් යම් විෂයකට යම් අමතර උදවුවක් ඕන ටියුෂන් පන්තියකින් කියල. මම ඒක එයාලට සලස්වල දෙනවා. එත කොට තව පැත්තකින් කෙනෙකුට තර්ක කරන්න පුළුවන් අපි කරන නාට්‍ය වැඩමුළු වත් ටියුෂන් පන්තියක් වගේනේ කියල...
මම හිතන්නේ නිර්මාණ කරුවාගේ ප්‍රකාශණය මොකද්ද කියන එක විනිශ්චය කළ යුත්තේ නිර්මාණය හරහා.

**වත්සලා : ප්‍රශ්ණය**
"ටියුෂන් මැජික්" කියූ විට මට මතකයට නැගෙන තවත් නිර්මාණයක් තිබුනා. 80 දශකයේ, සෝමලතා සුබසිංහ මහත්මිය විසින් නිර්මාණය කල, "විකෘති." මේ නිර්මා ණයේ දී කතා කලෙත්, දරුවන්ගේ මනස පීඩනයට පත්කරන විභාග ගැන, එය උදුරා ගත් ළමා කාලය ගැන. ඔබ මෙවර නිර්මා ණය කරන "ටියුෂන් මැජික් සහ "විකෘති" අතර යම් නෑකමක් තියෙනවද කියල කෙනෙක් ඇසුවොත්?

**කුසුම්සිරි : පිළිතුර**
නෑකම තියෙන්නේ පහත කරුණු කීපය එක්ක.

- වස්තුවිෂය එකම මානයක යොමුවන්නක් වීම.
- යශෝධරා විකෘති නාට්‍යයේ ප්‍රධාන භූමිකාව කාලාන්තරයක් නිරූපණය කිරීම.
- මා ද දර්ශන වාර කිහිපයකට රංගනයෙ න් දායක වීම.
- 'විකෘති' මා ද ආකර්ශනය වූ නාට්‍ය නිර්මාණයක් වීම.

අපි ගත්තොත් ආදරය විෂය කොටගෙන ලෝකේ පුරාවේ විවිද මාදිලියේ නිර්මාණ දහස් ගණනක් බිහිවෙලා තියෙනවා. එත් ඒවා එකිනෙකට වෙනස් කතා සාරයන් ඇතුලේ වෙනස් ශෛලීන් ඇතුලේ වෙනස් ඉදිරිපත් කිරීම්. ඒ වගේම තමයි විකෘති සහ ටියුෂන් මැජික් වස්තුවිෂය තුළ සමානකම් තිබුනට දෙයාකාරයක නිර්මාණ දෙකක්.

**වත්සලා : ප්‍රශ්ණය**
80 දශකයේ දී සෝමලතා මහත්මිය විකෘති නිර්මාණය කර කතා කළකී දේ තුළින් නොදැකපු වෙනසක් සම්පූර්ණයෙන්ම නොවුනත් යම් ප්‍රමාණයකට හෝ මේ නිර්මාණය කිරීම තුළින් ඔබ බලාපොරොත්තු වෙනවද? ඔබ හිතනවද, මෙවැනි නිර්මාණ කිරීම තුළින් වේගයෙන් දුවන ජීවිත වෙනත් මානයක් ඔස්සේ හරවා යැවීමට හැක වේවි කියා?

**කුසුම්සිරි : පිළිතුර**
වත්සලා, ලංකික පසුබිම තියෙන වත්මන් දෙමාපියෝ අපි බොහොමයක් දෙනා විභාග කේන්ද්‍රීය දැනුම මැනපු, ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් අත්විදපු උදවිය. ඒ රැටි රේස් එකට මැදි වෙච්ච අය. ඒ ක්‍රමවේදය තුළින් අපි තුළ නිර්මාණය කරල තියෙන ඛේදවාචකයක් තියෙනවා. දරුවෙක් අම්මගේ කුස පිළිසිඳගත් මොහොතේ ඉඳලම ජනප්‍රිය පාසැල්, ශිෂ්‍යත්ව විභාග, අනාගත වෘත්තිය, සමාජ තරාතිරම... වගේ හීතිකාවන්ගෙන් දරුවන්ව ගොදුරු කරගන්න අපි ඉඩ දීල තියෙනවා. ළමා මනෝවිද්‍යාත්මක සංකල්ප, දාර්ශනිකයින්ගේ අදහස් මතවාද හැම දෙයක්ම පොත් අස්සේ හංගල දාල. විභාග ඉලක්ක කරගත්තු ක්‍රමයට ශබ්ද නගමින් රැලි නගන්න ඉඩදීලා ඒ රැල්ලේම පා වෙනවා.
මහත්මා ගාන්ධි තුමා ළමා අධ්‍යාපනය ගැන දැරූ අදහස උනේ මෙහෙම එකක්.
"අධ්‍යාපනය යන්නෙන් මා අදහස් කරන්නේ ළමයාගේ මනස හා අධ්‍යාත්මයේ උපරිමය ඉස්මතු කිරීමයි"
අධ්‍යාපනය යනු කුමක්ද යන්නට එතුමා ගේ අදහස උනේ "හිස, හදවත සහ අත දියුණු කිරීම" යන අදහස. තවත් දාර්ශනික අදහස් වලින් කීපයක් සිහිපත් කලොත්...
"අධ්‍යාපනය යනු, නිරෝගී ශරීරයක් තුළ නිරෝගී මනසක් බිහි කිරීම" ඇරිස්ටෝටල්
"අධ්‍යාපනය යනු, කය සහ ආත්මය සංවර්ධනය කිරීම" ප්ලේටෝ
මම මේවා සිහිපත් කරන්නේ මමත් ඒ අදහස් එක්ක එකඟ වෙන නිසා.
අවාසනාවකට බොහොමයක් දෙනාගේ රැටි රේස් එකේ තියෙන්නේ හිස පමණක් පුරවන අධ්‍යාපන ක්‍රමයක්. ඔබේ ප්‍රශ්නයට මම දෙන දීර්ඝ පිළිතුර සීමා කලොත් ඕස්ට්‍රේලියානු වාසී ශ්‍රී ලාංකික සම්භවයක් ඇති දරු පරපුරට, මගේ අදහස මෙහෙම එකක්-
මගේ දරුවන්ගේ අධ්‍යාපනය ඇසුරෙන් මම ලබන අවබෝධය අනුව මේ රටේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය වෙමින් පවතිනවා. විභාග මූලික දැනුම මනින, ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙමින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය වෙමි න් පවතිනවා. එහෙම පසුබිමක ජීවත්උනත් අපි ඇතැමුන් අපේ අත්දැකීම් වලින් පොදි බැඳගෙන එන හීතිකාවන් නිසා දරුවන්ව පරණ පුරුදු රැටි රේස් එකටම තල්ලුකරල දුවවනවා. ඉලක්කයට. දිනුම් කණුව ලඟට. එතැනදී බොහොමයක් දෙනාට අමතකවෙන දෙයක් තමයි ඒ දිනුම් කණුව මොකද්ද කියන එක. ඒ දිනුම් කණුව කොහෙද තිෙ යන්නේ කියන එක. 'ටියුෂන් මැජික්' නාට්‍ය නිර්මාණය තුළින් දරන වෑයම් කිහිපයක් තිබෙනවා. ඉහත කී කරුණු කරනා ගැන දෙවතාවක් සිතන්න, සුළුතරයකට හෝ අවකාශයක් නිර්මාණය කිරීම එකක්. අපේ නාට්‍ය ප්‍රේක්ෂකාගාරය උදෙසා රසවින්දනාත්මක නාට්‍ය අත්දැකීමක් නිර්මා ණය කිරීම තව එකක්. ශ්‍රී ලන්කන් තියටර් ගෲප් නාට්‍ය කැලේ දරුවන්ට, වැඩිහිටි සාමාජිකයිනට නාට්‍ය අභ්‍යාසයේ අත්දැකීම විඳින්නට අවකාශය නිර්මාණය කිරීම තවත් අභිප්‍රායක්.

**වත්සලා : ප්‍රශ්ණය**
සාමාන්‍යයෙන්, නිර්මාණ කරුවෙක් කියන්නේ යම් මතයක් යහපත් පරිදි සමාජ ගත කළ හැකි පුද්ගලයෙක්. නිර්මාණයක් කියන්නේ යම් පණිවිඩයක් සමාජය වෙත ගෙන යා හැකි වාහකයෙක්. එය එසේනම්, ඔබ සිතනවද "ටියුෂන් මැජික්" නිර්මාණය තුලින් ඔබ බලාපොරොත්තු වන පණිවිඩය සාර්ථකව සමාජගත කරන්නට හැකියි කියා?

**කුසුම්සිරි : පිළිතුර.**
'පණිවිඩයක් සමාජගත කිරීම' කියන අදහස ගැන දෙපාරක් හිතන්න ඕන. මොකද මගෙත් යශෝධාරාගේත් විශ්වාසය අපේ නිර්මාණ තුළින් පණිවිඩ සමාජගත කිරීමට උත්සාහ නොකරන බව. පණිවිඩ දෙන්න අපිට මීට වඩා පහසු ක්‍රම ගොඩක් තියෙන වා. නිර්මාණයකින් සිදුවෙන්නේ පණිවිඩයක් දීමෙන් ඔබ්බට ගිය කාර්යභාරයක්. සංවේදී කටයුත්තක්- වින්දනීය අත්දැකීමක්. නිර්මාණ කරුවෙක් ලෙස මම කරන්නේ හැමවිටම උත්සාහ කරන එක. ඒක සාර්ථ කද අසාර්ථකද කියන එක විනිශ්චය කල යුත්තේ ප්‍රේක්ෂක ඔබ.

**වත්සලා : ප්‍රශ්ණය**
අවසාන වශයෙන්, දරුවන් විසින් දරුවන් වෙනුවෙන් කරන නිර්මාණ මෙවැනි සමා ජයක වේදිකාගත කිරීම සහ ඔවුන් වෙනුවෙන් ප්‍රේක්ෂකාගාරයක් සූදානම් කිරීම එක්තරා ආකාරයක අභියෝගයක්. ඒ අභියෝගය ඔබ යම්තාක් දුරට ජයගත් කෙනෙක්. මෙවරත් එය ඔබට අභියෝගයක් වේවිද?

**කුසුම්සිරි : පිළිතුර**
නාට්‍ය කරුවෙකුට හැම නිර්මාණයක්ම අභි යෝගයක්. හැම නාට්‍ය දර්ශනයක්ම අභියෝග යක්. ඉන් ඉදිරියට ගිය අභියෝගයන් ගණනාවකට අපි මුහුණ දෙන වා. සරලව කීවොත් මේවගේ කාරණා- අපි වැඩ කරන්නේ බොහොමයක් දරුවොත් එක්ක. දරුවොත් එක්ක වැඩ කිරීමේදී තියෙන අභියෝග බොහොමයි. ඒ වගේම අපි අපේ නිර්මාණ වලට දක්ෂතා ලංකාවෙන් ආනයනය කරන්නේ නැහැ. හැම විටම උත්සාහ කරන්නේ තිබෙන සම්පත් වැඩි දියුණු කරන්න. එතැනදී අපි දැඩි වෙහෙසක් දරනවා. ප්‍රවේශ පත්‍රයක් රැගෙන එන ප්‍රේක්ෂකයාට සාදාරණය ඉෂ්ට කරන්න. මොකද මම හිතන විදියට අපිට නිදහසට කාරනා කියල වැඩක් නෑ ප්‍රේක්ෂක යාට. එතකොට අපේ නළුවෝ දරුවෝද, පළපුරුදු ශිල්පීන්ද, පුරුදු පුහුණු වෙන්න කාලය තිබුනද නැද්ද, වගේ කාරණා ප්‍රේක්ෂයට නිදහසට කාරණා විදියට දක්වනන් මම සූදානම් නැහැ.
එතැනදී මම ඉල්ලීමක් කරන්න කැමතියි අපිට අලුත් ප්‍රේක්ෂකයින්ගෙන්.
බොහොමයක් දෙනා තුළ තිබෙන මේකට සම්බන්ද අය "ලෝකල්" අයනේ කියන සිතුම් රටාව අමතක කරලා නිර්මාණය අත්විඳින්න මනස හදාගෙන ඇවිත් බලන්න.
මේ වගේ කී නොකී නොයෙකුත් අභියෝග තිබුනට මමත් යශෝධාරත් විශ්වාස කරනවා අපිට මුණ ගැසිලා ඉන්නවා සොඳුරු පිරිසක් කියලා. නාට්‍ය කලාවට ආදරය කරන, ලැදියාව තියෙන පිරිසක්. ඒ අයගේ සහාය නිසා අපේ කාර්යයන් පහසු වෙනවා. නාට්‍ය යක් කියන්නේ සාමූහික ප්‍රයත්නයක්. ටියුෂන් මැජික් නාට්‍යයේ රංග වින්‍යාසය කරන්නේ 'හසිනි ඉලංගරත්න' දුව.
යශෝධාරාගේ සංගීත නිර්මාණයන් නාට්‍ය තුළ අධ්‍යක්ෂණය කරන්නේ 'නිමාෂිනි පැල්පොල' සහ 'හසන්ගා රාමනායක' දුවල දෙන්න. අපේ සොඳුරු නාට්‍ය පවුලේ දරුවෝ වැඩිහිටියෝ සියල්ලම ආදරයෙන් සිහිපත් කරන අතරතුරේ විශේෂයෙන් සටහන් කල යුතු චරිතයක් තමයි නිරෝෂා සොයුරිය- මේ හැමෝම අපේ අභියෝගයන් තරණය කරන්න බර කරට ගත්තු අය.
අනික තමයි අපේ නාට්‍ය අභ්‍යාසය හැමවිටම සජීවී කරලන මෙල්බර්න් අපේ ආදරණීය නාට්‍ය ප්‍රේක්ෂකාගාරය. ඒ අය පසුගිය දශකයකට වැඩි කාලයක් අපිත් එක්ක රැඳිලා සිටීම නිසා තමයි අපිට හැකියාව තියෙන්නේ නිරන්තරයෙන් මේ විදියට නිර්මාණකරණයේ නියැලෙන්න.
ඇතින් ඇසුනු අපූරු ගීත ඛණ්ඩය නැවත ඇසේ. ඒ වෙත ගොස් බලන්නට සිත් වුවත් එය නිර්මාණයක් ලෙස මුල සිටම සැන සිල්ලේ නැරඹිය යුතුයැයි සිත බලකරයි. 'ටියුෂන් මැජික්' සැබැවින්ම සොඳුරු නිර්මා ණයක් වනු ඇතැයි මාගේ හැඟීමයි. මන්ද, එය සුන්දර මිනිසුන් අතින් කෙරෙන තවත් සුන්දර නිර්මාණයක් නිසාවෙනි.